කොළඹ විශ්වවිද්‍යාලය
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී විශේෂ උපාධි තෙවන වසර පරීක්ෂණය
පළමු සෙමෙස්තරය - 2016/2017
**SLG 3160– සාම්ප්‍රදායික සිංහල ව්‍යාකරණ අධ්‍යයනය**
(පැ දෙකයි)

ප්‍රශ්න <u>තුනකට</u> (03) **පමණක්** පිළිතුරු සපයන්න.

---

1. "භාෂාවක විග්‍රහයට ලක්කළ යුත්තේ ඒ භාෂාවේම ව්‍යුහයයි." යන්න ප්‍රමාණ කොට සිදත් සඟරා ව්‍යාකරණය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

2. "සිදතේ සඟරාවේ නිර්දිෂ්ට වර්ණමාලාව ශබ්ද විද්‍යාත්මකව ඓතිහාසිකව පරිණාමය වූවකි." පහදා දෙන්න.

3. 'සිංහල වර්ණමාලාව නූතන ලේඛන ව්‍යවහාරයට අනුකූලව සංකීර්ණත්වයට පත් වූ ආකාරය' සමාලෝචනය කරන්න.

4. "සිංහල නාමපද ආශ්‍රිත ලිංග නැමති ව්‍යාකරණ ප්‍රවර්ගය සිදත් සඟරා කතුවරයා විසින් ඉදිරිපත් කර ඇත්තේ සිංහල ව්‍යාකරණ යථා පරිදි පරීක්ෂා කිරීමෙන් නොවන බව පෙනේ." විමසන්න.

5. "සිංහල නාම පද වරනැගීමේදී සචේතන සහ අචේතන ප්‍රභේදයක් මැනවින් ප්‍රකට වෙයි." විග්‍රහයක යෙදෙන්න.

6. අනාගත ආඛ්‍යාතය සිංහල ලේඛන ව්‍යවහාරයේ භාවිත වූ ආකාරය සනිදර්ශනව පහදා දෙන්න.

*********************